# 2024-08-21 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. "කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ" අධ්‍යාපන පද්ධතියට හඳුන්වා දීම

අනාගත ගෝලීය ප්‍රවණතා සඳහා මුහුණ දිය හැකි පුරවැසියන් බිහි කිරීමත්, ආර්ථික සංවර්ධනයට ඵලදායී ලෙස ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමත් යන අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වන පරිදි පාසල් සිසුන්ට කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත අධ්‍යයන කටයුතුවල නියැලීමට අවස්ථාව සැලසීම සුදුසු බවට හඳුනාගෙන ඇත. ඒ අනුව, එහි ආරම්භක පියවරක් වශයෙන් තෝරා ගත් පාසල් 100ක 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසුන්ගේ සහභාගිත්වයෙන් "කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත ශිෂ්‍ය සමාජ" නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමටත්, එම ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල මත පදනම්ව ඉදිරි වර්ෂයන් තුළදී මෙම වැඩසටහන අනෙකුත් පාසල් සඳහා ව්‍යාප්ත කිරීමටත් තාක්ෂණ අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 02. ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම

ස්වයං මූල්‍ය උත්පාදන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයෙහි ප්‍රධාන කාර්යාලය කොළඹ 07, විද්‍යා මාවතේ පිහිටා ඇති අතර, ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් ඒ ආසන්නයේ පිහිටි පෞද්ගලික ගොඩනැගිලි 02ක් බදු පදනම මත ලබාගෙන දැනට සිසුන් 3,000ක පමණ ප්‍රමාණයක් සඳහා අධ්‍යයන පාඨමාලා පවත්වාගෙන යනු ලබයි. වැඩි සිසුන් පිරිසකට එම ආයතනයේ අධ්‍යාපන පහසුකම් සලසා දීමට සහ නව අධ්‍යයන පාඨමාලා හඳුන්වා දීමට ඉඩ ප්‍රස්ථාව සැලසෙන පරිදි එම ආයතනය සඳහා නවීන තාක්ෂණයෙන් යුත් ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීමට යෝජනා වී ඇත. ඒ සඳහා ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනයෙහි ප්‍රධාන කාර්යාලය ආසන්නයේ පිහිටි පෞද්ගලික හෝ රජයේ ඉඩම් කොටසක් ආයතනයේ අරමුදල් යොදවා අත්කර ගැනීමටත්, එකී ඉඩම් කොටසෙහි නව ගොඩනැගිලි සංකීර්ණයක් ඉදි කිරීමටත් අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.




163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිරිපස හිස් ප්‍රදේශයේ (ලොබිය) සංචාර සේවා කවුන්ටර ක්‍රියාත්මක කිරීම**

සීමාසහිත ගුවන්තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළෙහි පැමිණීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ ඉදිරිපස හිස් ප්‍රදේශයේ (ලොබිය) සංචාර සේවා කවුන්ටර හයක් (06) ක්‍රියාත්මක කිරීම සඳහා ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 12ක් ලැබී තිබේ. එකී ලංසු ඇගයීමෙන් අනතුරුව, තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති ඉහළම මිල ගණන් ඉදිරිපත් කරනු ලැබ ඇති පහත සඳහන් ලංසුකරුවන් වෙත වසර 03ක කාලසීමාවකට එකී ප්‍රදේශයන් භාවිත කිරීම සඳහා අවසර ලබා දීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

| කවුන්ටර ප්‍රදේශයේ අංකය | ලංසුකරුගේ නම |
|---|---|
| 01 | Airport Tourist Drivers Association |
| 02 | Ayubowan Tours and Travels (Pvt) Ltd |
| 03 | Avawia Tours (Pvt) Ltd |
| 04 | Lanka Travel Agent Association |
| 05 | Casons Travels (Pvt) Ltd |
| 06 | JNW Lanka Tours |

04. **ශ්‍රීලංකන් ගුවන් සේවයේ මගීන් සහ ජංගම සෝපාන සේවා සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීම**

සෞදි අරාබියේ දම්මාම්, ජෙඩාහ් සහ රියාද් යන ගුවන්තොටුපොළවලදී මගීන් සහ ජංගම ගුවන් සෝපාන හසුරුවාලීමේ කොන්ත්‍රාත්තුව 2024-12-31 දිනෙන් අවසන් වීමට නියමිත අතර, චීනයේ ගුවැන්ග්සෝ ගුවන්තොටුපොළේදී මගීන් සහ ජංගම ගුවන් සෝපාන හසුරුවාලීමේ කොන්ත්‍රාත්තුව 2025-01-31 දිනෙන් අවසන් වීමට නියමිතව ඇත. එබැවින්, ඒ සඳහා යෝග්‍ය සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම පිණිස සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු කැඳවා තිබේ. ඒ අනුව, ලැබී ඇති ලංසු ඇගයීමෙන් අනතුරුව, තාක්ෂණික ඇගයීම්

කමිටුවේ සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති පහත සඳහන් සේවා සැපයුම්කරුවන් වෙත වසර 03ක කොන්ත්‍රාත් කාලසීමාවකට අදාළ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

* සෞදි අරාබියේ දම්මාම්, ජෙඩාහ් හා රියාද් ගුවන්තොටුපොළවල් සඳහා වන කොන්ත්‍රාත්තු Swissport Saudi Arabia Limited වෙත ප්‍රදානය කිරීම.

* චීනයේ ගුවැන්ග්සෝ ගුවන්තොටුපොළ සඳහා වන කොන්ත්‍රාත්තුව Guangzhoe Baiyun International Airport Co. Ltd වෙත ප්‍රදානය කිරීම.

**05. මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය වෙත ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව**

මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්ත සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය වෙත ප්‍රවේශ මාර්ග පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා දේශීය තරගකාරී ලංසු කැඳවීමේ පටිපාටිය අනුගමනය කරමින් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 10ක් ලැබී තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලංසුකරු වන මාගා ඉංජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**06. තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා තේ වගාකරුවන්ට පොහොර සහනාධාරයක් ලබා දීම**

පසුගිය කාලපරිච්ඡේදය තුළ පොහොර මිල ඉහළ යාම හා රසායනික පොහොර තහනම් කිරීම වැනි කරුණු හේතුවෙන් තේ වගාවේ පොහොර භාවිතය අඩුවීම තේ නිෂ්පාදනය පහළ යාමට බලපා ඇති බව හඳුනාගනු ලැබ ඇත. එබැවින්, තේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා පොහොර භාවිතය ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් තේ වගාකරුවන්ට සහනයක් ලබා දීම කාලීන අවශ්‍යතාවක් වී තිබේ. ඒ අනුව, රජයේ පොහොර සමාගම වන ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් මගින් කිලෝග්‍රෑම් 50

රසායනික පොහොර මිටියක් රුපියල් 4,000/-ක සහනයක් සහිතව තේ වගාකරුවන් වෙත ලබා දීම පිණිස කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. 2024/25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම්වල වගා කරන ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීම**

2024/25 මහ කන්නයේදී කුඹුරු ඉඩම්වල වගා කරනු ලබන වී සහ අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා ගොවීන් වෙත පොහොර සහනාධාරයක් ලබා දීම මඟින් රටෙහි ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමටත්, බෝග ඵලදායිතාව ඉහළ නැංවීමටත් හැකියාව පවතින බව නිරීක්ෂණය කර ඇත. ඒ අනුව, 2024/25 මහ කන්නය සඳහා රජයේ පොහොර සමාගම වන ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැනි ලිමිටඩ් හා පුද්ගලික අංශය මඟින් පොහොර ආනයනය කර ගොවීන් වෙත කරගකාරී මිලකට අලෙවි කිරීමටත්, වී වගාව සහ වෙනත් වගාවන් සඳහා වගා කරන ලද උපරිම හෙක්ටයාර දෙකක් සඳහා හෙක්ටයාරයකට රුපියල් 15,000.00 බැගින් මූල්‍ය සහනාධාරයක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දීමටත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනතේ විධිවිධාන පරිදි නිකුත් කරනු ලැබ ඇති නියෝග පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

"ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම" යටතේ වන තීරු බදු ලිහිල්කරණ වැඩසටහනෙහි සංයෝජිත වර්ගීකරණ සංකේතාංකයන්ට අදාළ වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බද්ද ඉවත් කිරීම සඳහා 2023-05-29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොළ සංවර්ධන බදු පනතේ විධිවිධාන පරිදි සාදන ලද නියෝගය, අංක 2377/39 දරන 2024-03-28 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝගය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **ගාස්තු රහිතව සංචාරක වීසා නිකුත් කිරීම පිළිබඳ විශේෂඥ කමිටු වාර්තාව**

ගාස්තු රහිතව සංචාරක වීසා නිකුත් කිරීමට අදාළව වෙනත් රටවල් විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදයන් පිළිබඳව කරුණු අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස විශේෂඥ කමිටුවක් පත් කිරීම සඳහා 2024-04-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පත් කරනු ලැබ ඇති විශේෂඥ කමිටුව විසින් ශ්‍රී ලංකාව සමඟ සංචාරක ක්ෂේත්‍රයේ තරගකාරී ලෙස කටයුතු කරනු ලබන රටවල් 08ක් පිළිබඳ කරුණු අධ්‍යයනය කර සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කර ඇති අතර ගරු ජනාධිපතිතුමා විසින් එකී වාර්තාව අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස ඉදිරිපත් කරන ලදී. එම විශේෂඥ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහාත්, එකී නිර්දේශ මත පදනම්ව 2024-10-01 දින සිට ආරම්භව මාස 06ක කාලයක් සඳහා හඳුනාගත් රටවල් උපරිම වශයෙන් 35කට දින 30කට වලංගු වන පරිදි ගාස්තු රහිතව වීසා නිකුත් කිරීම පිණිසත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

10. **ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද ණයවර ලිපියක් හරහා දින 30කින් ගෙවීමේ පදනම යටතේ 2024-11-15 සිට 2025-04-14 දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 03ක් (බැරල් 2,100,000 +/- 5%) මිල දී ගැනීම වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

ලංකා බැංකුව විසින් නිකුත් කරන ලද ණයවර ලිපියක් හරහා දින 30කින් ගෙවීමේ පදනම යටතේ 2024-11-15 සිට 2025-04-14 දක්වා කාලය තුළ මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 03ක් (බැරල් 2,100,000 +/- 5%) මිල දී ගැනීම පිණිස ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 05ක් ඉදිරිපත් වී ඇති අතර, සිංගප්පූරුවේ විටෝල් ඒෂියා පුද්ගලික සමාගම විසින් ඉදිරිපත් කරන ලද ලංසුව පමණක් ප්‍රතිචාරාත්මක ලංසුව ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබේ. ඒ අනුව, මර්බන් වර්ගයේ බොර තෙල් නැව් තොග 03ක් මිල දී ගැනීම සඳහා වන කොන්ත්‍රාත්තුව සිංගප්පූරුවේ විටෝල් ඒෂියා පුද්ගලික සමාගම වෙත පිරිනැමීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **2024-11-15 සිට 2025-04-14 දක්වා කාලය තුළ මර්බන් බොර තෙල් නැව් තොග 03ක් (බැරල් 2,100,000 +/-5%) ප්‍රසම්පාදනය වෙනුවෙන් වූ දිගුකාලීන කොන්ත්‍රාත්තුව**

2024-11-15 සිට 2025-04-14 දක්වා කාලය තුළ 100% ගබඩාගත ටැංකිවලින් නිකුත් කිරීමේදී ගෙවීමේ ක්‍රමවේදය යටතේ (100% Ex. Storage Modality) මර්බන් බොර තෙල් නැව් තොග 03ක් (බැරල් 2,100,000 +/-5%) ප්‍රසම්පාදනය සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවා ඇත. ඒ සඳහා සිංගප්පූරුවේ විටෝල් ඒෂියා පුද්ගලික සමාගම පමණක් ලංසු ඉදිරිපත් කර තිබේ. තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත පදනම්ව එම සමාගම වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් නිර්දේශ කර තිබේ. ඒ අනුව, අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **CHEC PORT CITY COLOMBO (PRIVATE) LIMITED ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම**

CHEC PORT CITY COLOMBO (PRIVATE) LIMITED සඳහා ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ අදාළ වන නිදහස් කිරීම් ද සහිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව 2024-09-07 දින සිට 2027-06-30 දින තෙක් දීර්ඝ කිරීම සඳහා 2024-08-05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ විධිවිධාන පරිදි නියමයක් අංක 2396/60 දරන 2024-08-09 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ. එකී නියමය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිණිස ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ධීවර කර්මාන්තයට ඇති වී ඇති බලපෑම අවම කර ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩසටහන**

කොවිඩ් - 19 වසංගත තත්ත්වය හා ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදයත්, ඉන්ධන මිල අධික ලෙස ඉහළ යාමත් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සඳහා අතිශය අහිතකර බලපෑමක් ඇති වී තිබේ. ධීවර යාත්‍රා හිමිකරුවන්ට යාත්‍රා දියත් කිරීම සඳහා ඉන්ධන වෙනුවෙන් විශාල කාරක ප්‍රාග්ධනයක් වැය කිරීමට සිදු වන අතර, එමගින් ධීවර කර්මාන්තයට යාත්‍රා යෙදවීම සීමා වී ඇත. එබැවින්, ධීවර කර්මාන්තය සඳහා භාවිත කරනු ලබන ඉන්ධන වෙනුවෙන් සහනයක් ලබා දීම තුළින් එකී කර්මාන්තය කඩිනමින් යථා තත්ත්වයට පත් කිරීමේ අවශ්‍යතාව හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, මාස 06ක කාලසීමාවක් සඳහා ඉන්ධන වශයෙන් ඩීසල් භාවිත කරන ධීවර යාත්‍රා හිමිකරුවන්ට ඩීසල් ලීටරයකට රුපියල් 25/-ක් බැගින් සහ භූමිතෙල් ඉන්ධන වශයෙන් භාවිත කරන ධීවරයින්ට දිනකට භූමිතෙල් ලීටර 15ක් බැගින් මාසික උපරිම දින 25ක් සඳහා භූමිතෙල් ලීටරයකට රුපියල් 25/- බැගින් "ධීවර කර්මාන්තය යථා තත්ත්වයට පත් කිරීමේ දීමනාවක්" ලබා දීම පිණිස මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා සහ ධීවර අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**************